සබරගමු පළාත - සති පාසල - තුන්වන වාරය

ඒකකය 5

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය

පැවරුම 5

ක්‍රියාකාරකම - මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය හා ඩොනමෝර් ප්‍රතිසංස්කරණ හඳුනාගනිමු

හැඳින්වීම -1920 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන්( මැනිං) ලාංකිකයන්ගේ අපේක්ෂාවන් ඉටු නොවුණු නිසා ලාංකිකයන් විසින් දිගින් දිගටම සිය උද්සෝෂණ සිදු කරනු ලැබීය සිදුකරනු ලැබීය ඒ අනුව 1924 දී යටත් විජිත භාර ලේකම් ඩෙවොන්ෂයර් විසින් මෙම ප්‍රතිසංස්කරණය හඳුන්වා දුන් අතර ඒ සඳහා මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ පදනම් කරගත් නිසා එය මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය නම් විය.

1920 ප්‍රතිසංස්කරණය මෙරට ක්‍රියාත්මක වූයේ ඉතා කෙටි කාලයකි. එහි පැවති ප්‍රධාන දුර්වලතාවය වූයේ පාලන බලතල හා වගකීම් විසන්ධි ව පැවැතීමයි. එය රටේ පරිපාලනය දුර්වල කිරීමට හේතු විය . ඒ නිසා 1931 දී ඩොනමෝර් කොමිසමේ යෝජනා පදනම් කරගනිමින් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මෙරටට හඳුන්වා දෙන ලදී.

සිසු උපදෙස්

පියවර 1 - පෙළ පොතෙහි පිටු අංක 106 සිට 110 දක්වා හොඳින් කියවන්න.

පියවර 2- පසුගිය සති පාසල් පැවරුම් සටහන් අවසන් කළ ස්ථානයට යටින් ඉහත දී ඇති හැඳින්වීම සටහන් කර ගන්න

පියවර 3 -පහතින් දී ඇති ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න. (එහිදී පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය සටහන් කර පිළිතුරු වීම අනිවාර්ය වේ )

<u>ප්‍රශ්නාවලිය</u>

1. මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශ ඉදිරිපත් කළ ආණ්ඩුකාරවරු වන්නේ,
2. මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ මෙරට හඳුන්වාදුන් සමයේ යටත්විජිත භාර ලේකම්වරයා ලෙස කටයුතු කළේ කවුරුන්ද ?
3. මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ යටතේ ඇති කළ ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය ඇඳ දක්වන්න
4. මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය පැවති ප්‍රධාන දුර්වලතාවය කුමක්ද ?
5. ඩොනමෝර් කොමිෂම මෙ රටට පත්කර එවන ලද වර්ෂය කුමක්ද?
6. ඩොනමෝර් කොමිසමේ ප්‍රධානියා නම් කරන්න.
7. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා දෙක ලියා ඒවා කෙටියෙන් විස්තර කර දක්වන්න .
8. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය තුළ ව්‍යවස්ථාදායකය හැඳින් වුයේ කුමන නමකින්ද ?
9. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වාදුන් හඳුන්වා දුන් රාජ්‍ය නිලධාරීන් තිදෙනකු නම් කරන්න.
10. සර්ව ජන ඡන්ද ඡන්ද බලය හිමි වූ ප්‍රථම ආසියාතික රට කුමක්ද ?